# ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
## தேசிய சம்பளங்கள் மற்றும் ஆளணி ஆணைக்குழு
## NATIONAL SALARIES AND CADRE COMMISSION

කාමර අංක 2-116, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
அறை இல. 2-116,பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07
Room No.2-116, B.M.I.C.H, Bauddhaloka Mawatha. Colombo 07

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 2669134 | ෆැක්ස්<br>பக்ச்<br>Fax | 2669134 | විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல்<br>E-mail | nscc@sltnet.lk |
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NSCC/5/31/SR-III | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | PSC/EST/02-01-34 /01/2019 | දිනය<br>திகதி<br>Date | 2019.07. 05 |


ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති නිලධාරී තනතුර (MN-06) සඳහා වන උසස් කිරීමේ පරිපාටිය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ අමතන ලද මාගේ සමාංක හා 2019.06.20 දිනැති ලිපිය හා බැඳේ.

02. මෙම කරුණට අදාළව අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී එළඹෙන ලද එකඟතාවයන් සැලකිල්ලට ගෙන උක්ත ලිපියේ සඳහන් මෙම කොමිෂන් සභාවේ නිර්දේශ පහත පරිදි සංශෝධනය කරන බව කාරුණිකව දන්වමි.

I. 2013.11.04 දිනට ප්‍රථම දෙවන කාර්යක්ෂමතා කඩඉම වන පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කර ඇති නිලධාරීන් එම සුදුසුකම සම්පූර්ණ කළ දින සිට 2013.11.04 දින දක්වා වැටුප් වර්ධක උපයාගෙන ඇති වසර ගණනට අනුරූපීව MN – 6 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ අනුරූපී පියවරේ තැබීම.

II. එසේ අන්තර්ග්‍රහණය කිරීමේදී පශ්චාත් උපාධි සුදුසුකම ලබා වසර 10 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සමඟ වැටුප් වර්ධක 10 ක් උපයාගෙන ඇත්තාවූද ශ්‍රේණිගත උසස්වීම් සඳහා වන අවශ්‍යතා සපුරා ඇත්තාවූද නිලධාරීන්ට ඉහත I ඡේදය පරිදි කල්පිත වශයෙන් MN -6 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ වැටුප ලබා දී එම වැටුප 2013.11.04 දින ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව I ශ්‍රේණියේ වැටුපට පරිවර්තනය කර නියමිත වැටුපේ පිහිටුවීම.

III. ඉහත II පරිදි වසර 10 ක සේවා කාලයක් සපුරා නැති නිලධාරීන් MN – 6 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ නියමිත පියවරෙහි පිහිටුවීම.

IV. 2013.11.04 දිනට පෙර පශ්චාත් උපාධි සුදුසුකම ලබාගත් නිලධාරියෙකුට ඉහත සඳහන් පදනම මත හිමිවන වැටුපට වඩා වැඩි වැටුපක්, MN - 4 වැටුප් පරිමාණය යටතේ දැනට ලබන වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය යටතේ MN – 6 වැටුප් ක්‍රමයට පරිවර්තනය කිරීම මගින් හිමිවේ නම් එම වැඩි වැටුප ලබා ගැනීමට ඉඩදීම.

V. 2013.11.04 දිනට පසු පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කරන ලද නිලධාරීන්, ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය පරිදි පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කරන ලද දින සිට MN – 6 වැටුප් ක්‍රමයේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.

අනුර ජයවික්‍රම
ලේකම්
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව.

පිටපත :-

1. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.
3. ලේකම්, අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව - 2019.06.04 දිනැති සාකච්ඡාව අනුව කරු.දැ.ගැ.ස.